5583

OL/2023(2024)/16-S-I, II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**16 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023(2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023(2024)
General Certificate of Education (Ord. Level) Examination, 2023(2024)

| | | | |
|---|---|---|---|
| ඉස්ලාම් | I, II | | පැය තුනයි |
| இஸ்லாம் | I, II | | மூன்று மணித்தியாலம் |
| Islam | I, II | | *Three hours* |

| | | |
|---|---|---|
| **අමතර කියවීම් කාලය** - **මිනිත්තු 10 යි** | | **අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.** |
| மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள் | | |
| Additional Reading Time - 10 minutes | | |

## ඉස්ලාම් I

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** 'කිසිදු සැකයකින් තොරව දැඩිව විශ්වාස කොට පිළිගැනීම' යන අර්ථය දෙන පදය,
(1) අකීදා ය. (2) වසීලා ය. (3) අත්තස්කියා ය. (4) අල් ෆික්හු ය.

**2.** 'ජබීරත්' යන්නෙහි අර්ථය
(1) කිල්ලක් ඇතිවීම ය. (2) තුවාලයක් මත දමා ඇති වෙළුම ය.
(3) තයම්මුම්හි අංග ය. (4) අවයවයන් හි ජලය ගැල්වීම ය.

**3.** සිත හා සම්බන්ධ වූ 'ඉබාදත්'
(1) උල්හියියා, ඉවසීම ය. (2) අල් කුර්ආන් පාරායනය, මානසික පාරිශුද්ධතාවය ය.
(3) ඉවසීම, ඉඛ්ලාස් ය. (4) උපවාසය, දික්ර් ය.

**4.** සලාතයේ 'දුආඋල් ඉස්තිෆ්තාහ්' යනු
(1) සූරා ෆාතිහා පරායනය ය. (2) අත්තහියියාත් පරායනය ය.
(3) සලාතයේ දී ප්‍රාර්ථනාවන් කිරීම ය. (4) වජ්ජහ්තු පරායනය ය.

**5.** ඉස්ලාමික අරමුණින් වෙළෙඳාමක් වලංගුවීමට අවශ්‍ය පදනමක් **නොවන්නේ,**
(1) ඊජාබ් - කබූල් ය. (2) ලාභය සඳහන් කිරීම ය.
(3) වෙළෙඳ භාණ්ඩ ය. (4) විකුණන්නා සහ පාරිභෝගිකයා ය.

**6.** ශ්‍රී ලංකාවේ සිට හජ් වන්දනාවේ යන්නන් නියියත් සිදු කළ යුතු මීකාත්
(1) මක්කා ය. (2) දුල් හුලෛෆා ය. (3) කර්නුල් මනාසිල් ය. (4) යලම්ලම් ය.

**7.** 'අල්කස්රු වල්ජම්උ' යන පද ප්‍රයෝගය කුමන ඉබාදතය හා සම්බන්ධ ද?
(1) සලාතය (2) සකාත් (3) උපවාසය (4) හජ්

**8.** මියගිය සැමියා වෙනුවෙන් ඉද්දා ඉටුකරන ස්ත්‍රිය අනිවාර්යයෙන් වැළකී සිටිය යුතු කාර්යය
(1) රැකියාවට යෑම ය. (2) විවාහ වීම ය.
(3) වෛද්‍යවරයෙකු හමුවීම ය. (4) සුන්නත් වූ උපවාසය ඉටු කිරීම ය.

**9.** 'උපවාසයේ යෙදෙන්නෙකු සතුටට පත් වන අවස්ථා දෙකකි' හදීසයෙහි සඳහන් වන පරිදි එම අවස්ථා දෙක වනුයේ,
(1) සඳ දකින විට සහ රාමසාන් උත්සවය සමරන විට දී ය.
(2) උපවාසය අවසන් කරන විට සහ තමාගේ දෙවිඳුන් මුණගැසෙන විට දී ය.
(3) උපවාසය අවසන් කරන විට සහ රාත්‍රී යාඥාවන්හි නියැලෙන විට දී ය.
(4) සහර් ආහාර අනුභව කරන විට සහ උපවාසය අවසන් කරන විට දී ය.

[දෙවැනි පිටුව බලන්න.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**10.** භාර්යාව ස්වාමි පුරුෂයාගෙන් දික්කසාදයක් ඉල්ලා ලබා ගැනීම
(1) තලාක් වේ. (2) ෆස්කු වේ. (3) කුල්උ වේ. (4) ලිහාර් වේ.

**11.** හජ් සඳහා ඉහ්රාම් ඇඳ නියියක් සිදු කළ පුද්ගලයෙකුට සිදු කිරීමට අනුමැතිය **නොමැති** එක් ක්‍රියාවක් වන්නේ,
(1) සුන්නත් වූ සලාත ඉටු කිරීම ය. (2) සුවඳ විලවුන් ගැල්වීම ය.
(3) නෑම ය. (4) නිදා ගැනීම ය.

**12.** තව්බා (පව් කමා කිරීමට ඉල්ලීම) සිදු කරනුයේ,
(1) රාමලාන් මාසයේ ය. (2) සිකුරාදා දිනයේ ය.
(3) නිශ්චිත කාල වකවානුවක් නොමැත. (4) හජ් කාල සීමාවෙහි ය.

**13.** මුස්ලිම්වරයෙකුගේ ධනය පිරිසිදු කරන ආගමික ක්‍රියාව (ඉබාදත්) කුමක් ද?
(1) සලාතය (2) සකාත් (3) උපවාසය (4) හජ්

**14.** නබිතුමාගෙන් වඩාත් යහපත් රැකියාව කුමක් දැයි විමසූ විට ඔහුගේ පිළිතුර වූයේ,
(1) කර්මාන්ත සහ දඩයම් කිරීම යන්න ය.
(2) කර්මාන්ත සහ බොරු මිශ්‍ර නොවූ වෙළෙඳාම යන්න ය.
(3) බොරු මිශ්‍ර නොවූ වෙළෙඳාම සහ තැරැව්කාර සේවය යන්න ය.
(4) තැරැව්කාර සේවය සහ කර්මාන්ත යන්න ය.

**15.** "නිශ්චිතවම අල්ලාහ් මොහුගේ සිතෙහි හා මුඛයෙහි සත්‍යයය තබාගෙන ඇත." යනුවෙන් නබිතුමා ප්‍රසංසා කොට පැවසූ සහාබි
(1) උමර් (රලි) ය. (2) සඃද් ඉබ්නු අබී වක්කාස් (රලි) ය.
(3) උස්මාන් (රලි) ය. (4) තල්හා (රලි) ය.

**16.** පහත සඳහන් අය අතුරෙන් විවාහ වීම තවකාලිකව තහනම් කරන ලද අයෙකු වන්නේ,
(1) භාර්යාවගේ මව ය. (2) භාර්යාවගේ සහෝදරිය ය.
(3) සහෝදරියගේ දුව ය. (4) සහෝදරයාගේ දුව ය.

**17.** 'ඉල්හාද්' යන පදයෙහි අර්ථය
(1) ආදේශ කිරීම ය. (2) කුහකකම ය.
(3) විශ්වාසය කඩ කිරීම ය. (4) අදේවවාදය ය.

**18.** රාජ්‍ය කුමන්ත්‍රණවලින් තමාගේ ඊමානය ආරක්ෂා කරගත් තරුණයන්ගේ ඉතිහාසය පිළිබඳව සඳහන් වන සූරාව
(1) සූරතුල් බකරා ය. (2) සූරතුල් අඃරාෆ් ය.
(3) සූරතුල් කහ්ෆ් ය. (4) සූරතුල් හුජුරාත් ය.

**19.** මානව හිමිකම් සහතික කිරීම පිණිස සිදුකළ මදීනා ශාසනය සහ මග්නාකාටා ශාසනය අතර කාල සීමාව
(1) ශතවර්ෂ දෙකකි. (2) ශතවර්ෂ හතරකි. (3) ශතවර්ෂ හයකි. (4) ශතවර්ෂ අටකි.

**20.** "අහ්ලුස්සුන්නා වල්ජමාආ" සංකල්පය අනුව මහා පාපකර්මයක නියැළි මුස්ලිම්වරයෙකු,
(1) පාපිෂ්ඨයෙකු බවට පත් වේ. (2) කුහකයෙකු බවට පත් වේ.
(3) දෙවියන් ප්‍රතික්ෂේප කරන්නෙකු වේ. (4) පිළිකුලට බඳුන් වන්නෙකු වේ.

**21.** පහත වගුවෙහි '**අ**' තීරුවේ අරාබි වචන කිහිපයකුත් '**ආ**' තීරුවේ එවාට අදාළ සිංහල අර්ථ ද දී ඇත.

| | 'අ' | 'ආ' |
|---|---|---|
| (1) | ඉල්ම් | A - නිර්ණය කිරීම |
| (2) | කුද්රත් | B - දැනුම |
| (3) | ඉරාදත් | C - බුද්ධිමතා |
| (4) | කද්ර් | D - ආශාව |

ඉහත '**අ**' තීරුවේ දී ඇති අනුපිළිවෙළ අනුව '**ආ**' තීරුව සැකසූ විට නිවැරදි වරණය කුමක් ද?
(1) A B C D (2) B C D A (3) B D C A (4) D B C A



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**22.** අයියාමුත් තෂ්රීක් දින වන්නේ,
(1) දුල්හජ් සඳ 1, 2, 3 ය. (2) දුල්හජ් සඳ 11, 12, 13 ය.
(3) දුල්හජ් සඳ 15, 16, 17 ය. (4) දුල්හජ් සඳ 21, 22, 23 ය.

**23.** පහත හදීසය සම්පූර්ණ කරන්න.
"සලාතයේ යතුර වුළූ වේ.
ස්වර්ගයේ යතුර .................................... වේ."
(1) හජ් (2) උපවාසය (3) සකාත් (4) සලාතය

**24.** කෑබතුල්ලා (මස්ජිදුල් හරාම්) හි ඉටුකරන සලාතය, සලාත් කීයකට සමාන වේ ද?
(1) ලක්ෂයකට (2) පනස් දහසකට (3) දහසකට (4) පන්සීයකට

**25.** පහත වගුවේ 'අ' , 'ආ' තීරුවල උමර් (රළි) තුමාගේ පරිපාලන ක්‍රියාවන් පහසු කිරීමට ඇති කරන ලද කාර්ය අංශ සඳහන් කර ඇත.

| | 'අ' | 'ආ' |
|---|---|---|
| (1) | වාලි | A - ප්‍රධාන ලේකම් |
| (2) | කාතිබ් | B - පොලිස් අධිකාරි |
| (3) | කාළි | C - ආණ්ඩුකාරවරයා |
| (4) | සාහිබුල් අහ්දාද් | D - නීතිපති |

ඉහත 'අ' තීරුවේ දී ඇති අනුපිළිවෙළට ගැළපෙන ආකාරයට 'ආ' තීරුව සැකසූ විට නිවැරදි වරණය කුමක් ද?
(1) A B D C (2) B D A C (3) C A D B (4) D A C B

**26.** කලීෆා උස්මාන් (රළි) සමයේ කුමන්ත්‍රණ ඇති කිරීමට ක්‍රියාකළ පුද්ගලයා වන්නේ,
(1) මුසෙලමා ය. (2) උත්බා ය.
(3) අබූලහබ් ය. (4) අබ්දුල්ලා ඉබ්නු සබාඃ ය.

**27.** නබි (සල්) තුමාගේ ප්‍රකාශය පරිදි යම් මිනිසෙකු වියදම් කරන දිනාර්වලින් වඩාත් යෝග්‍ය වන්නේ,
(1) තම පවුලට වියදම් කිරීම ය. (2) මාර්ගස්ථ දුගියන්ට වියදම් කිරීම ය.
(3) අසල්වැසියන්ට වියදම් කිරීම ය. (4) පොදු කටයුතු සඳහා වියදම් කිරීම ය.

**28.** විවාහයක දී වගකිවයුත්තා (වලි) ලෙස සිටීමට යෝග්‍ය **නොවන්නේ**,
(1) මවගේ සහෝදරයා ය. (2) පියා ය. (3) පියාගේ පියා ය. (4) විනිසුරුවරයා ය.

**29.** පුද්ගලයෙකුට සකාත් නියම වීම සඳහා ඔහු සතුව සිටිය යුතු අවම එළුවන් සංඛ්‍යාව
(1) 10 කි. (2) 20 කි. (3) 25 කි. (4) 40 කි.

**30.** ඉස්ලාම් දෘෂ්ඨිකෝණයෙන් කෙනෙකු උසස් වන්නේ,
(1) ආර්ථිකය මගින් ය. (2) පවුල් බලයෙන් ය.
(3) දෙවියන් කෙරෙහි ඇති බියෙන් ය. (4) අලංකාර පෙනුමෙන් ය.

**31.** ඊමාන් හැත්තෑවකට වඩා වැඩි ශාඛාවන්ගෙන් යුක්ත ය. එයින් උසස් ම වන්නේ 'ලා ඉලාහ ඉල්ලල්ලාහ්' යන කලිමාව වේ. නබි (සල්) තුමා හඳුන්වන ලද ආකාරය අනුව මෙහි ඉතාමත් පහළ මට්ටම කුමක් ද?
(1) ලැජ්ජා වීම (2) සිනාසීම
(3) භෝජන සැපයීම (4) මාර්ගයේ බාධාවන දෑ ඉවත් කිරීම

**32.** පහත දී ඇති වචන සලකන්න.

| | | |
|---|---|---|
| A - අල්ෆිද්යා | D - අල්කිරාත් | G - සුහ්ද් |
| B - තස්කියියා | E - තව්බා | H - වහි |
| C - ඉක්ලාස් | F - අර්රිබා | I - වරඌ |

ඉහත වගුවට අනුව අධ්‍යාත්මික වර්ධනය සඳහා ඉස්ලාමික මගපෙන්වීම පමණක් සඳහන් කරන වචන කාණ්ඩය වන්නේ,
(1) A B C D E ය. (2) A C D F G ය. (3) B C D E F ය. (4) B C E G I ය.

[ඉතරවැනි පිටුව බලන්න.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

5583

**33.** පහත වගුවෙහි **'අ'** තීරුවේ නබි වරුන්ගේ නම් සහ **'ආ'** තීරුවේ ඔවුනට ලබාදුන් ආශ්චර්යයන් ද සඳහන්ව ඇත.

| | 'අ' | 'ආ' |
|---|---|---|
| (1) | මූසා (අලෛ) | A - රෝගියෙකු අතගා සුව කිරීම |
| (2) | ඉබ්රාහිම් (අලෛ) | B - ගල්තලාවකින් ඔටුවෙකු පිට වීම |
| (3) | සාලිහ් (අලෛ) | C - ගින්න ශාන්තිමත්ව සිසිල් බවට පත්වීම |
| (4) | ඊසා (අලෛ) | D - සැරයටිය සර්පයෙකු බවට පත් කිරීම |

ඉහත **'අ'** තීරුවේ දී ඇති අනුපිළිවෙළට ගැළපෙන පරිදි **'ආ'** තීරුව සැකසූ විට නිවැරදි තේරීම කුමක් ද?

(1) B A C D (2) B C D A (3) C B A D (4) D C B A

**34.** 'ෆික්හුල් අව්ලවියියාත්' යනු

(1) නීති විද්‍යාව ය.
(2) ඉජ්තිහාද් කලාව ය.
(3) මූලිකත්වය දිය යුතු දේ ගැන වූ නීති ඉලක්ක ය.
(4) පුරා විද්‍යාත්මක ඉලක්ක ය.

**35.** උපවාසය සිදු කිරීමට හරාම් වූ දිනයන්ගෙන් එකක් වන්නේ,

(1) ඊදුල් ෆිත්ර් දිනය ය.
(2) තමාගේ විවාහ දිනය ය.
(3) උත්සව දිනය ය.
(4) ගමන් සිදු කරන දිනය ය.

**36.** 'සෆ්උමුඅල්ලකාත්' යන්නෙන් අදහස් වන්නේ,

(1) නිසඳැස් එකලස් කිරීම ය.
(2) ඉතිහාසය එකලස් කිරීම ය.
(3) කලාවන් ගැන තොරතුරු එකලස් කිරීම ය.
(4) පුරාවෘත්ත ගැන තොරතුරු එකලස් කිරීම ය.

**37.** "නාඳුනන පිරිමියෙක් සහ ස්ත්‍රියක් තනිව සිටින අවස්ථාවක ඔවුන් අතර ෂෛතාන්ද සිටියි" යන්න

(1) අල්කුර්ආන් ප්‍රකාශයකි.
(2) නබි තුමාගේ ප්‍රකාශයකි.
(3) සහාබිවරයෙකුගේ ප්‍රකාශයකි.
(4) විද්වතෙකුගේ ප්‍රකාශයකි.

**38.** නබි (සල්) තුමා විසින් අල්කුර්ආනය ලේඛනගත කරන ලෙස විධානය කළේ,

(1) අහ්ලුස්සුෆ්ෆාවරුන්ට ය.
(2) අන්සාරිවරුන්ට ය.
(3) කුත්තාබුල් වහිට ය.
(4) හාෆිලුල් කුර්ආන්ට ය.

**39.** හජ් සම්පූර්ණ කරමින් සිටි නබි (සල්) තුමා මීක්කාත්වලට ගැසීමට තමාට ගල්කැට එක්රැස්කර ගෙන එන ලෙස ඉබ්නු අබ්බාස් (රළි) තුමාගෙන් ඉල්ලා සිටි විට ඔහු ගෙනෙන ලද්දේ

(1) කුඩා ගල්කැට ය.
(2) ලොකු ගල්කැට ය.
(3) විශාල ගල්කැට ය.
(4) බොරළු ගල්කැට ය.

**40.** පහත දැක්වෙන වචන කාණ්ඩ සලකන්න.

| | 'අ' | 'ආ' |
|---|---|---|
| (1) | මුෂාරකා | A - විවාහය |
| (2) | තලාක් | B - හජ්, උම්රා |
| (3) | සඅයු | C - නීති මූලාශ්‍රය |
| (4) | ඉජ්මාඋ | D - වෙළෙඳාම |

ඉහත **'අ'** තීරුවේ දී ඇති අනුපිළිවෙළට ගැළපෙන ආකාරයට **'ආ'** තීරුව සැකසූ විට නිවැරදි වරණය කුමක් ද?

(1) A C D B (2) B C D A (3) D A B C (4) D C A B

* *



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**16 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023(2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023(2024)
General Certificate of Education (Ord. Level) Examination, 2023(2024)

ඉස්ලාම් I, II
இஸ்லாம் I, II
Islam I, II

## ඉස්ලාම් II

* **පළමුවන** ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* පළමුවන ප්‍රශ්නයට ලකුණු **20** ක් ද, තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ද හිමි වේ.

**1.** කෙටි පිළිතුරු සපයන්න.

(i) නජීස්වූ සතෙක්ව සිටියත්, එයට වද දීම ඉස්ලාම් දහමේ තහනම් කොට ඇති සතුන් **දෙදෙනෙකු** සඳහන් කරන්න.

(ii) ෂාෆි මද්හබ් පදනමින් කුනූත් පරායනය සුන්නත් කළ සලාත් **දෙකක්** සඳහන් කරන්න.

(iii) 'බයිඅතුෂ් ෂජරා' යන සම්මුතියට යොදන අනෙක් නම කුමක් ද?

(iv) ඉස්ලාමීක කලා අතුරෙන් මුලින් ම බිහි වූ කලාවක් සඳහන් කොට, එම කලාවේ ස්වර්ණමය යුග මොනවා දැයි සඳහන් කරන්න.

(v) අබූබක්ර් (රළි) තුමාට 'අස්සිද්දීක්' යන ගෞරව නාමය පිරිනැමීමට හේතුව කුමක් ද?

(vi) කලීෆා උස්මාන් (රළි) තුමාගේ වැදගත් සේවා **දෙකක්** සඳහන් කරන්න.

(vii) ශ්‍රී ලංකා මුස්ලිම්වරුන්ගේ මුල්කාලීන ජනාවාස තිබූ නගර **දෙකක්** සඳහන් කරන්න.

(viii) ඉස්ලාම් දහමෙන් ලබා දී ඇති මානව හිමිකම් **දෙකක්** සඳහන් කරන්න.

(ix) ස්ථිර මහ්රම් ඇතිවීමට හේතුවන කරුණු **දෙකක්** දක්වන්න.

(x) ඇතැමුන් ඉපයීම කෙරෙහි නොසැලකිලිමත්ව සිටීමට හේතු ලෙස ඉමාම් මාවර්දි සඳහන් කර ඇති හේතු අතුරෙන් **දෙකක්** ලියන්න.

**2.** (i) ෂිර්ක්හි ප්‍රධාන වර්ග **දෙක** නිදසුන් සහිතව දක්වන්න.

(ii) ඊමාන් කෙරෙහි බලපාන කරුණු **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

(iii) සලාතයේ දී ප්‍රවේසම්වන මුඃමින්වරයෙකුට ලැබෙන ප්‍රයෝජන **පහක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

**3.** (i) නබි (සල්) තුමා විසින් ස්වර්ගයට ආශිර්වාද කළ සහබාවරුන් දසදෙනා අතුරෙන් **දෙදෙනෙකුගේ** නම් සඳහන් කරන්න.

(ii) 'සිහාහුස් සිත්තා' යන නමින් හඳුන්වන හදීස් ග්‍රන්ථ **හයක** නම් ලියන්න.

(iii) 'සුන්නා' යනු කුමක් දැයි සඳහන් කොට, ඒවාට අනුගත විය යුතු බව සඳහන් අල්කුර්ආන් සහ හදීස් මූලාශ්‍ර **එකක්** බැගින් සඳහන් කරන්න.

**4.** (i) ඉතිහාසයේ බිහි වූ ව්‍යාජ නබිවරුන් **දෙදෙනෙකුගේ** නම් සඳහන් කරන්න.

(ii) උපවාසයෙන් ඇතිවන ලෞකික හා පරලෞකික ප්‍රයෝජන **තුනක්** බැගින් සඳහන් කරන්න.

(iii) ශුද්ධ වූ කෘබා හි ඉතිහාසය කෙටියෙන් පැහැදිලි කරන්න.

[හයවැනි පිටුව බලන්න.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**5.** (i) සකාත් ලබාගැනීමට සුදුසුකම් **නොලබන** අය අතුරෙන් පාර්ශ්ව **දෙකක්** සඳහන් කරන්න.

(ii) සූරා ලුක්මාන් හි සඳහන් වන යහපත් ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න.

(iii) සහාබාවරුන් සම්බන්ධව අහ්ලුස්සුන්නා වල්ජමාහි අකීදාව කෙටියෙන් පැහැදිලි කරන්න.

**6.** (i) මුස්ලිම්වරු හතර දෙනෙක්ව වාණිජ උපදේශකවරුන් ලෙස පත් කළ පොළොන්නරු යුගයට අයත් රජු කවු ද?

(ii) ඉස්ලාම් දහම ශ්‍රී ලංකාවට හඳුන්වාදීමට පෙර, ශ්‍රී ලංකාව අරාබිවරුන් නවාතැන් ගත් ස්ථානයක් බවට පත් වූයේ ඇයි දැයි හේතු **තුනක්** සඳහන් කරන්න.

(iii) 'ඉස්ලාම් දහම පදනම් වූ යුතුකම්, යහපත් කල් ක්‍රියාවන් කෙරෙහි ආකර්ෂණය කර හුරුපුරුදු කරයි' යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

**7.** පහත මාතෘකාවලින් ඕනෑම **දෙකක්** ගැන කෙටි සටහන් ලියන්න.

(i) ඉමාම් ෂාෆිඊ (රහ්)

(ii) ආහාර පුරුදු පිළිබඳ ඉස්ලාමික උපදෙස්

(iii) කලීෆා අලි (රලි) තුමාගේ පුද්ගල චර්යා

(iv) ශ්‍රී ලංකාවේ ආර්ථික අභිවෘද්ධියට මුස්ලිම්වරුන්ගේ දායකත්වය

* * *